**මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව - 2017**

**මඩකලපුව**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------**

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහපොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ විවිධ මූල්‍යානයන්ගෙන් රු. 17,519,397ක් මාර්ග සහ මහජන ක්‍රීඩාංගන ඉදිකිරීම සඳහා වැය කර තිබුණි. මෙහිදි ද්‍රව්‍ය වියදම් ගිණුම හර කිරීම වෙනුවට ස්ථාවර වත්කම් ගිණුම හර කර තිබුණි.

(ආ) කසළ වෙන්කිරීමේ මධ්‍යස්ථානයක් මාවඩි මුන්මාරිවල රු. 397,853ක වියදමින් ඉදිකර තිබුණි. මෙහිදි වත්කම් ගිණුම හර හා මුලධන ආධාර ගිණුමට ගිණුම බැර නොකර තැන්පතු ගිණුම හරහා ආදායම් හා වියදම් ගිණුම් ගත කර තිබුණි. මෙම ක්‍රියාවෙන් මූලධන ආධාර ගිණුම සහ වත්කම් ගිණුම්වලින් රු . 397,853ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

**-----------------------------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ)** 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | |
| (i) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 197 වගන්තිය | සෑම මාසයක් අවසානයේදීම පාරිභෝගික ගබඩා ලේඛනය ලේකම්වරයා විසින් පරීක්ෂා කොට අත්සන් තබා නොතිබුණි. |
| (iii) X පරිච්ඡේදයේ 198 වගන්තිය | පොත් පිළිබඳ වෙනමම ලැයිස්තුවක් තබා නොතිබුණි. |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ)** 2012 ජනවාරි 05 දිනැති අංක 02/2002 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු.2,520,668 ක් වටිනා කොන්ක්‍රීට් මංමාවත් ඉදිකිරීම, ක්‍රීඩා පිටි ප්‍රතිසංස්කරණය සහ කසල වෙන්කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම ආදී කාර්යයන් සඳහා අනුමත කළ සංගම් තේරීමේදී මෙම චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,410,502ක් විය. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,604,178 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,193,676 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය සමාලෝචනය**

**තිරසාර සංවර්ධන අරමුණු**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2014 වර්ෂයේ නිෂ්පාදිත මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය 2015 පෙබරවාරි 25 දින සභාවට භාර දී තිබුණි. යන්ත්‍රය ක්‍රියා කරවිය හැකි පුහුණු කළ අයෙකු අනුයුක්ත නොකර වාහන රියදුරෙකු වශයෙන් කම්කරුවකු ප්‍රාදේශීය සභා ලේකම්වරයා විසින් 2015 දෙසැම්බර් 02 දින සිට යොදවා තිබූ අතර මෙම යන්ත්‍රයේ එන්ජිම 2016 දෙසැම්බර් 06 දින සිට ක්‍රියාවිරහිත වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

රියැදුරු සහ පුස්තකාලයාධිපති තනතුරු සඳහා අනුමත කළ සේවක සංඛ්‍යාව පිළිවෙලින් 04 ක් සහ 02 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ සිට රියදුරු තනතුරු සඳහා එක් අයෙකු පමණක් බඳවාගෙන තිබූ අතර පුරප්පාඩුව පවතින තනතුරු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 සහ 2017 වර්ෂවලදී ලංසු කැඳවීමේ පරිපාටියෙන් බැහැරව පට්ටිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් සුභසාධක සංගමයට පිළිවෙලින් රු.70,100 ක් සහ රු.73,605 ක් සඳහා කෝවිල් උත්සව කාල වාහන නැවතුම්පොළ ලබා දී තිබුණි. මෙම සංගමයෙන් 2017 වර්ෂයේ විකුණා තිබූ ටිකට්පත් අනුව රු.521,550 ක ආදායම් උපයාගෙන තිබූ අතර, වාහන නැවතුම්පොළ ආරක්ෂාව සඳහා බෙදාහැර තිබූ ටිකට්පත්වල සභාවේ රබර් මුද්‍රාව තබා නොතිබුණි. සභාව විසින් මෙම සේවාව සිදුකළේ නම් සභාවට රු.521,550 ආදායම් උපයා ගැනීමට හෝ නැතහොත් අයකළ ගාස්තුවේ වටිනාකම අඩු කොට බැතිමතුන්ට මෙම සේවාව සැපයිය හැකිව තිබුණි.

(ආ) 2016 සහ 2017 වර්ෂවලදී එකතුව රු.5,993,786 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පන්ඩාරියාවෙලි, කට්සේනෙයි, මාවඩි මුන්මාරි යන ප්‍රදේශවල සිටින පවුල්වලට ජලය සැපයීම් සේවාව ලබාගැනීම වෙනුවෙන් ලබා දී තිබුණත් මේ දක්වා එම ප්‍රදේශවල ජනතාවට ජලය ලබා දී නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ගිණුම්කරණය | ලෙජර ගිණුම් යාවත්කාලීනව හා නිසි අයුරින් පවත්වා ගත යුතුය. |
| (ආ) අයවැය පිළියෙල කිරීම | අයවැය පිළියෙල කිරීමේදි අදාල විෂයයන් විශ්ලේෂණය කිරීම හා අවධානය යොමු කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) ආදායම් කළමනාකරණය | ආදායම් මූලාශ්‍ර හඳුනා ගෙන ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතුය. |